කැලණිය විශ්වවිද්‍යාලය
මානවශාස්ත්‍ර පීඨය
15 - 6 - 1998
කැලණිය.

# නාට්‍යමය ලක්ෂණ කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් සබරගමු නර්තන සම්ප්‍රදායේ ශාන්තිකර්ම පිළිබඳ සමාජ සංස්කෘතික අධ්‍යයනයක්

කැලණිය විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර පීඨයේ දර්ශනපති උපාධි පරීක්ෂණය සඳහා ඉදිරිපත් කෙරෙන නිබන්ධය

**ධම්මිකා ලංකාතිලක**

ලි. අංකය - මාශාපි/දප/94/01

**1998**

## සාර සංග්‍රහය

සබරගමු යන නාමය පිළිබඳ අර්ථ විග්‍රහය, අතීත පළාත් බෙදුම, භූගෝලීය ලක්ෂණ හඳුන්වා දෙමින් සබරගමුවේ ඓතිහාසික හා සංස්කෘතික වටිනාකම මෙම නිබන්ධයේ පළමු පරිච්ඡේදයෙන් අධ්‍යයනය කෙරෙන අතර, දෙවන පරිච්ඡේදයෙන් තත් පළාතේ ඇදහිලි හා විශ්වාසයන් ව්‍යාප්ත ව ඇති ආකාරයත්, ශාන්තිකර්ම හා වෙනත් කර්තව්‍යයන්හිත් පුද ලබන්නා වූ දෙවියන් හා යකුන් පිළිබඳ අධ්‍යයනයත් ඇතුළත් වේ.

තෙ වැනි පරිච්ඡේදයෙන් සබරගමු සම්ප්‍රදායයේ මඩු තේවා නම් විශේෂ පදයෙන් හඳුන්වනු ලබන දේව ශාන්තිකර්ම හඳුන්වා ඊට අන්තර්ගත වූ උපත් කථා, අතුරු උපත් කථා හා පූජා රටාව පිළිබඳ විග්‍රහයක් ඉදිරිපත් කොට ඇත. හතර වැනි පරිච්ඡේදයෙන් වර්තමානයේ ගිලිහී යමින් පවතින සබරගමුවේ යක් තොවිල් කිහිපයක් හඳුන්වා, ඊට අන්තර්ගත උපත් කථා හා පූජා රටාව පිළිබඳ විග්‍රහයකි.

පස්වැනි පරිච්ඡේදයෙන් ස්ථිර වශයෙන් ම අන්තර්ගත විය යුතු සබරගමු නර්තන සම්ප්‍රදායයේ දේව ශාන්තිකර්ම හා යක් තොවිල් කිහිපයක නාට්‍යමය පෙළපාළි හා එහි මූලික ලක්ෂණ, කථා, ප්‍රවෘත්ති, චරිත, භාෂාව හා සංවාද, රංග භාණ්ඩ, වස්ත්‍රාභරණ, රංග උපක්‍රම පිළිබඳ විමර්ශනයකි. පූර්වෝක්ත පරිච්ඡේදයෙන් දැක්වූ නාට්‍යමය පෙළපාළිවලට අන්තර්ගත වූ ඓතිහාසික සිද්ධි හා අවස්ථා පිළිබඳවත්, එ මගින් හෙළි වන සමාජ සංස්කෘතික වටිනාකමත්, වෙනත් නර්තන සම්ප්‍රදායයන්හි නාට්‍යමය පෙළපාළිවල සමාන අසමානතා හා ඒවා කොතෙක් දුරට විදග්ධ නාට්‍ය කලාව හා සම්බන්ධ වන්නේ ද යන්නත්, හය වැනි පරිච්ඡේදයෙන් සාකච්ඡා කෙරේ.

සබරගමු නර්තන සම්ප්‍රදායයේ ඇතුළත් නාට්‍යමය පෙළපාළිවළ වාග් කෝෂය සුවිශේෂ පද හා වෙනත් නර්තන සම්ප්‍රදායයන්හි නාට්‍යමය පෙළපාළිවල විශේෂ පද අතර පවත්නා සම්බන්ධයත්, හත් වැනි පරිච්ඡේදය යටතේ තුලනාත්මක විග්‍රහයක් කෙරේ.

සබරගමු නර්තන සම්ප්‍රදායයේ දේව තෝත්‍ර හා යක් තො විල්වල දී ඒකරාශි කර ගත් නාට්‍යමය පෙළපාළිවල වාග් කෝෂය උපග්‍රන්ථයෙහි අන්තර්ගත කොට ඇත.

---